# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2285/15 - 2022 ජුනි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2022.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

#### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම මේ නිවේදනයෙන් ;

01. දෙහිවල, කවුන්සිල් පාර, අංක 210 දරන ස්ථානයේ පිහිටි "සමස්ත ලංකා සංචාරක සේවා සපයන්නන්ගේ සංගමය" නමැති සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථයන් ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයන් වශයෙන් නියම කරමි ; සහ

02. ඒ ආඥාපනතෙහි 5(4) වගන්තියේ විධිවිධානවලින් නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ජුනි මස 22 වැනි දින,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය,
ලෝටස් පාර,
කොළඹ 01.

EOG 06 - 0198

1A - G 37003 - 08 (2022/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*